# ඇඩික් 14

ජගත් ජේ එදිරිසිංහ ලියයි

"ජීවිතේ කියන්නෙ බිස්නස් එකක් බං... මේ ගණුදෙනුව හරියට කරන්න දන්න එකා දිනනවා.. අනිත් එවුන්ට ඕන්නං පුලුවන් දින්න එවුන් පස්සෙ වැටිලා කොහොමින් කොහොමින් හරි ජීවිතේ ගැට ගහ ගන්න.." අයෝමා සේවකයකු විසින් ගෙන එන ලද තේ කෝප්පය මේසය හරහා තිළිණ දෙසට තල්ලු කරමින් කියයි.

ඔහුගේ සුපුරුදු ලෙස අවුල්ව ගිය කෙස් වැටියත් පොඩිවූ කමිසයත් අයෝමා ගේ සිතේ ඇති කරන්නේ කණගාටුවකි.

"ඒ උඹ හිතන හැටි..." තිළිණ තේ කෝප්පය අතට ගනියි. දහවලට යමක් නොකෑ බව ඔහුට සිහිපත් වන්නේ එයින් උගුරක් දෙකක් බොන අතර ය. "..උඹ ඉන්නෙ මහා මුළාවක අයෝ..."

ඈ ඔහු දෙස බලන්නේ අවඥාවෙනි.

"උඹ ඉන්නෙ විශ්ව විද්‍යාල මානසිකත්වයෙ.. ඒකයි උඹට එහෙම හිතෙන්නෙ.. රීඩ් මාවතෙන් මෙහා පැත්තට පැන්නම තියෙන ලෝකෙට ඔය වචන සෙට් එකවත් ඔය තියරියවත් හරියන්නෙ නැහැ බං.. උඹ මං ඉන්නෙ මුළාවක කියලා කියනකොට මාත් ඒකම උඹට කියනවා.. ඔය වැට පැනලා මෙහා පැත්තට වරෙන්.. ලෝකෙ අපි උඹල දකින විදිහට වඩා කොයි තරම් වෙනස්ද කියලා එතකොට පෙනෙයි.."

තිළිණ හිස ඔසවා අයෝමා දෙස බලයි. ඔහුගේ දෑසෙහි රැඳී ඇති කළකිරීම අප්‍රසාදය ඇගෙන් සැඟවිය නොහැකි ය.

"උඹේ ඇස්වල තියෙන ඔය බැල්මෙන්ම මාත් මිනිස්සු දිහා බලපු කාලයක් තිබුණා.. අවස්ථාවාදියො.... බඩගෝස්තරවාදියො.... දේශපාලන බැලයො.... ඔය වගේ හැම වචනයක්ම මාත් එදා ඒ මිනිස්සුන්ට ආරෝපනය කළා.. ඒත් මේක තේරුම් ගනින්.... මහා දාර්ශනික මතවාද කරේ තියන් අපි විශ්ව විද්‍යාලෙ ඇතුල ඇන කොටා ගත්තට අපි රූකඩ විතරයි.... අපි නටන්නෙ වෙන කාගෙවත් න්‍යායපත්‍ර වලටය කියන එක අපට තේරෙන්නෙ නැහැ.... ඒ පරිසරයෙදි ඒක තේරුම් ගන්නත් බැහැ.... අපව නටවන්නෙ මෙන්න මේ පුටු වල ඉන්න මහත්හොරුන්ගෙ අවශ්‍යතා මත කියන එක මටත් තේරෙන්නෙ දැන් තමයි...."

"උඹ ඔය හදන්නෙ උඹේ කරණම සාධාරණීකරණය කරන්න.... උඹ හදන්නෙ උඹේම හිත රවටා ගන්න...."

"රවටගන්න හිතක් නෑ බං මට.... මම කරන දේවල් ගැන මගේ හිතේ දෙගිඩියාවක් නැහැ"

"මට උඹ ගැන දැනෙන්නෙ මහා අප්පිරියාවක් අයෝ.."

අයෝමා සිනාසෙයි. ඈ මේසය හරහා ඉදිරියට ඇදී ඔහුගේ දෑත අල්ලා ගනියි.

"උඹ හරිම අවංකයි.... තාම කෙළින් කතා කරනවා.. හෙට අනිද්දා උපාධි සහතිකේ ගත්තට පස්සෙත් ඔය අවංක කම ඒ හැටියටම තියාගන්න බලපං.. ඒකෙන් උඹටවත් වෙන කාටවත් ප්‍රයෝජනයක් නැතිවුණත් මං කැමතියි උඹව ඒ විදිහට දකින්න... මං මෙතැන ඉඳන් උඹ දිහා බලං ඉන්නං..."

ඔහු හිස් තේ කෝප්පය දෙස බලා සිටින අතර ඇය සිය අසුනේ වඩා පහසු ඉරියව්වකට මාරු වෙයි..

"....මේ තුන් ලෝකෙම පාලනය කරන බලය තියෙන්නෙ මේ අද මං ඉන්න තැන.... මං වෙලාවකට ඒ බලය අතට අරගෙන ඒ අතට මේ අතට පෙරළලා බලනවා.... උඹ දන්නවද ඒ වෙලාවට කොයි තරම් තෘප්තියක් දැනෙනවද කියල....? උඹ නොදන්නවට මේ ගමන එන්න පළමුවෙනි පාඩම මට තේරුම් ගන්න පුලුවන් වුණේ උඹ නිසා.... හරියටම කියනවා නම්.... උඹේ පන්ති තහනම් වුණ වෙලාවෙ... එදා මං පළමුවෙනි වතාවට බලය නිසි ලෙස භාවිතා කිරීම කියන පාඩම අත්හදා බැලුවා.... පළමුවෙනි උත්සාහයෙන්ම මං දිනුවා.."

තිළිණ ඈ දෙස බලන්නේ විමතියෙනි. මේ හෙළිදරව්ව ඔහු කම්පාවට පත් කරයි. තමා කෙරෙහිම ඇතිවන කෝපයකින් හා කළකිරීමකින් ඔහුගේ සිත දැවී යයි.

"උඹ ඔය කතාව මට කලින් කිව්වා නං පන්ති තහනම් කළ වෙලාවෙ මං ආයෙම කැම්පස් එන්නෙ නැතුව ගෙදර ගිහින් කුලී වැඩ කරනවා.... ඒක නම්බුකාරයි.."

"මං කා එක්ක වත් අමනාප නැහැ නංගි..." ඔහු මොහොතකට නවතියි. "..අපි කවුරුත් යන්නෙ අපි එක් එක්කෙනා වෙනුවෙන් හැදිල නියම වෙලා තියෙන පාරවල් වල .. අපි කැමති වුණත් නොවුණත් ඒක වෙනස් කරන්න අපට බැහැ.. ඔයා යන ගමන ඔයා යන්න.. ඒ ගමන හරිද වැරදිද හොයන්න දැං මං උත්සාහ කරන්නෙ නෑ..." ඔහුගේ හඬ පහත් නමුත් නිරවුල් ය. වම් අතින් ගියරය මාරු කරන ඔහු නැවත වතාවක් ඇගේ මුහුණ බලයි. "..මං යන්නං.."

"අනේ බබා වෙන්නැතුව හිටපං බං.... උඹ හිතුවෙ ශක්‍ර දේවෝත්තමයාණන්ගෙ පඬුපුල් ආසනේ උනු වෙලා උඹේ පන්ති තහනම අයින් කළා කියල ද....? උඹ ඒ වෙලාවෙ නිකම්වත් මගෙන් ඇහුවද කොහොමද අයෝ මේ වැඩේ කළේ කියලා..? නිකම් උගුරට හොරා බේත් කන්න හදන්ඩ එපා බං.."

ඔහු නැවත කල්පනාවට වැටෙයි. ඇය කියන්නේ සැබෑවකි. ඒ මොහොතේ අවශ්‍යව තිබුණේ මොනයම් හෝ ක්‍රියාමාර්ගයකින් පන්ති තහනම ඉවත් කරවා ගැනීම පමණක් නොවේද?

"ඔය හැටි කල්පනා කරන්න එපා සහෝදරයා.... ඉස්සෙල්ල උපාධි සහතිකේ අතට අරගෙන අර දුක් විදින අම්මගෙ දෑතෙ ඒක තියල ඒ අම්ම වින්ද වේදනාවට සාධාරණය ඉෂ්ඨ කරපං..." අයෝමා මේසයට දෑත් තබා තිළිණ ගේ දෑසට එබී බලයි. "..ඊට පස්සෙ ඕන්නං කල්පනා කරලා පංති සටන හරි වෙන මොන දෙයක් හරි කරන්න උඹට නිදහස තියෙනවා.. "

00000000

මලසුන මත විසිර තිබූ පර මල් වේවැල් කූඩයට දැමූ පොඩි හාමුදුරුවෝ පිරිසිදු රෙදි කඩකින් පිඟන් ගඩොල් මතුපිට පිස දමන්නේ ඉතා සීරුවෙනි. තමන් වහන්සේට මඳක් පිටුපසින් සිට බලා සිටිනා සුනන්ද දෙස නොබලා ම ඔහු බොහෝ කල් ගනිමින් මේ කර්තව්‍යයෙහි නිරතව සිටිති. භාවනාවක යෙදී සිටින්නා සේ ය.

සුනන්ද හදිසියේ කොළඹ ආවේ හෝටලයේ කටයුත්තකට ය. ඉක්මණින් නැවත නුවර යා යුතු වූ නමුදු පන්සලට ගොඩ නොවී නැවත යන්නට ඔහුගේ සිත ඉඩ නොදුන්නේ ය.

"එක මනුස්සයෙක් වතාවක් බොහොම වේදනාවකින් පන්සලකට ආවලු... ඇවිත්.. හාමුදුරුවනේ මම හොඳටම අධෛර්යයට පත් වෙලයි ඉන්නෙ.. මං දැන් මොකද කරන්නෙ.. කියලා ඇහුවලු.. හාමුදුරුවො බොහොම සාන්ත දාන්තව කිව්වලු.. ගිහින් අනිත් අය ධෛර්යමත් කරපන්.. කියලා.." පොඩි හාමුදුරුවෝ පරමල් කූඩය බිම තබමින් සුනන්ද දෙසට හැරෙයි. ".. සුනන්ද මහත්තයා මෙහෙන් ගියේ අධෛර්යයට පත් වෙලා.. එපා වෙලා.. කළකිරිලා... මිනිස්සුන්ට මහත්තයා ඕනෙ වෙන වෙලාවක මහත්තයා බොහොම ඈතට යන්න ගිහිං.."

සුනන්ද බිම තිබූ කූඩය අතට ගෙන පොඩි හාමුදුරුවන් පසුපසින් ඇවිද එයි. බුදු කුටියේ ආලින්දයේ පඩි පෙළ බැස වැලි මිදුලට පය තබන පොඩි හාමුදුරුවෝ නැවතෙති.

"මං පැනල ගියා නෙවෙයි අපේ හාමුදුරුවනේ.. ජීවිතේ මොකක් හරි වෙනසක් ඕනෙයි කියලා මට හිතුණා.."

ගං වතුරට බණ මඩුවේ සෙවණ ලද පිරිස අතැර දමා ගිය කුණු රොඩු එකතු කර පන්සල් බිමේ කෙළවරකට වන්නට සෙදෝරිස් ගිණිමැලයක් අවුළුවා ඇත. කුණු රොඩු දමා ගියවුනට දෙස් දොවොල් දෙමින් ඔහු වරින් වර කුණු ගොඩ අලුත් කරයි සුනන්ද පර මල් කූඩය ද ඒ ගිණි මැලයටම එක් කර කූඩය සෙදෝරිස් අතටම දෙයි.

"මහත්තය කවදාවත් තමන් ගැන විතරක් හිතලා වැඩ කළ මිනිහෙක් නෙවෙයිනෙ... එහෙම හිතනකොට මේකත් පලා යාමක්ම තමයි.."

"මාව තවදුරටත් අවශ්‍ය නැති තැනක රැ‍ඳෙන්න බෑ අපේ හාමුදුරුවනේ.. හිතට එකඟ නැති වැඩක නිරත වෙන්න මට හිත හදාග න්න බැහැ.. ඒක මහා මානසික වදයක්.. දැං මං සැනසීමෙන් ඉන්නවා.."

"මනසින් පාලනය වෙනවා වෙනුවට මනස පාලනය කරන්න අපට පුලුවන් වෙන්න ඕනෙ.. පරමාදර්ශී චරිත හරි පරමාදර්ශී සමාජයක් හරි අපට කොහෙදිවත් හමුවෙන්නෙ නෑ මහත්තය... ඒත් කමක් නැහැ.. දැන් කරගෙන යන වැඩ කටයුතු වලින් සහනයක් ලැබෙනවා නම් ඒකත් දෙයක්නෙ.."

සෙදෝරිස් විසින් රටා තබා අමදින ලද වැලි මිදුල හරහා ඔවුහු ආවාසය දෙසට ඇවිද

අනෙක් පිටුවට

